සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## නාට්‍ය හා රංගකලාව

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- පහත දැක්වෙන තොරතුරු ඇසුරින් ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - සෝබාව දේ මෙපුර සිරි විසිතුරු බලනු මිතුරු මඟ පියකරු වූ
සුසුදු වලාකැරලි පලසකි මේ මග දිග ඇති රූ......

B - වෙදා නටන්නේ පළමුව සබේට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙව්ලන්නේ

C - වැඩක නොයෙදූ සිත - නරක අතටම පෙරලෙත
කිමෙක වන යහපත - වැඩක එබැවින් යොදනු තම සිත

D - මම මේ මහ මූකලානේ එහා ගම්මානේ
මමයි ආච්චි විතරයි ගෙදර ඉන්නේ.....

E - කුමටද සොබනියේ කඳුලු සලන්නේ
හේතුව මම නොදනිම්......

01) "සිරිත් මල් දම" කෘතියට අයත් ගීතයකි,

1. A 2. B 3. C 4. D

02) සත්ව චරිතයක් හා සම්බන්ධ නාට්‍යයකට අදාල ගීතයක් වන්නේ,

1. B 2. C 3. D 4. E

03) තාරාවෝ ඉගිලෙති නාට්‍ය ට අයත් ගීතයකි,

1. E 2. D 3. A 4. C

04) සොකරි නාටකයට අදාල ගීතය වන්නේ,

1. A 2. B 3. C 4. D

05) D සංවාද කාණ්ඩය අයත් නාට්‍ය වන්නේ,

1. වලහා සහ මාෂා
2. පුංචි අපට දැන් තේරෙයි.
3. අමර ගියා දිව්‍යලෝකෙ
4. නෙලුම් කුමාරි

- නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

( තේමාව, ආහාර්ය අභිනය, රංග විධාන, පරිකල්පනය, ගැටුම, රංගවස්ත්‍රාභරණ )

06) වේදිකාවට පිටතින් ගෙනෙන දේවල් .................................... අයත් වේ.

07) නාට්‍ය පෙළක වරහන් තුළ ........................................... දක්වා ඇත.

08) නාට්‍ය පෙළින් ප්‍රකාශ වන අදහස ............................................ නම් වේ.

09) ........................................... යනු අලුතින් යමක් සිතන් මවා ගැනීමයි.

10) ............................................ වේෂභූෂණ නමින් හඳුන්වයි.

- වගුව ඇසුරුකරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| වේශභූෂණ<br>අංගරචනය<br>රංගාලෝකය<br>වේදිකා ලංකර | මනමේ<br>සිංහබාහු<br>රත්තරන් | බුද්ධගජ්ජය<br>සකස්කඩ<br>නම් පොත | සතුට<br>විස්මය<br>දුක<br>පිළිකුල |

11) ආනුශාංගික කලාවන් දැක්වෙන තීරුව වන්නේ,

1. A　　2. B　　3. C　　4. D

12) නාට්‍යධර්මී නාට්‍ය ඇතුළත්ව ඇත්තේ,

1. C තීරුවේය.　　2. B තීරුවේය.　　3. D තීරුවේය.　　4. A තීරුවේය.

13) කටහඬ අභ්‍යාස සඳහා යොදා ගනු ලබන අංග දක්නට ලැබෙන්නේ,

1. D වල.　　2. C වල.　　3. A වල.　　4. B වල.

14) ආහාර්ය අභිනයට අයත් අංග ඇතුළත් තිරුව වන්නේ,

1. B　　2. C　　3. D　　4. A

15) සාත්වික අභිනයන් ප්‍රකාශ වන තීරුව වන්නේ,

1. A　　2. C　　3. D　　4. B

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16) නළුවාගේ ශරීරය හා මනස අතර සම්බන්ධතාවය රැකගැනීම සඳහා කරනු ලබන්නේ,

1. සතත අභ්‍යාස　　2. රංග අභ්‍යාස　　3. රූපණය　　4. කටහඬ අභ්‍යාස

17) ශරීරය සැහැල්ලු කිරීමේ අභ්‍යාස,

1. ශිථිලකරණ අභ්‍යාස　　2. සංවේදන අභ්‍යාස　　3. ශ්වසන අභ්‍යාස　　4. තාපන අභ්‍යාස

18) චරිතයක වේශය ගැනීම,

1. සමාරෝපයයි.　　2. අනුකරණයයි.　　3. අනුරූපණයයි.　　4. අභිනයයි.

19) චරිත වල අභ්‍යන්තර හා බාහිර ලක්ෂණ නිරූපණය කිරීම සඳහා නළුවන් තෝරාගැනීම යනු,

1. පෙළ රචනයයි.　　2. රංග භූමි පාලනයයි.　　3. අංගරචනයයි.　　4. නළුවරණයයි.

20) සංවාද භාවිතා නොකර සියුම් ප්‍රකාශන මගින් චරිත නිරූපණයක යෙදෙන්නේ,

1. ක්ෂණික නිරූපණයේදීය　　2. අභිරූපන රංගනයේදීය

3. අනුරූපණ රංගනයේදීය　　4. අනුකරණ රංගනයේදීය

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.
- පහත සඳහන් සංවාද කාණ්ඩය උපයෝගී කරගෙන අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

මොකටද මෙහෙට ආවෙ?.....
පාර වැරදිලා මට ගෙදර යන්න පාර කියනවද?....
(තනිවම) ඇත්ත තමයි කෙළි පැටියෙක්...මේකි බය කරගන්න ඕනෙ....
මෙහෙට එනවා හොඳයි මම පාර කියන්නම් හැබැයි මම අහන ඒවට උත්තර දෙන්න ඕනේ....
(හැඬුම් ස්වරයෙන්) හා.... අහන්න බලන්න....
මෙයාට උත්තර දෙන්න බැරි ප්‍රශ්නයක් අහන්න ඕනෑ...... කැලේ ගැන දන්නවද?
ඔව්....................

01) i. ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍ය කුමක්ද?
ii. එහි අධ්‍යක්ෂවරයා කවුරුන්ද?
iii. ඉහත නාට්‍ය පෙළෙහි ඇතුළත් රංග විධානයක් ලියන්න.
iv. ඉහත සංවාදයේ යෙදෙන චරිත දෙක නම් කරන්න.
v. මෙම නාට්‍යයේ ඇතුළත් වන සත්ව චරිත ලියන්න.

02) i. අභිනයේ ප්‍රභේද කීයද?
ii. එම ප්‍රභේද නම් කරන්න.
iii. ප්‍රභේද දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න.

03) i. නාට්‍යයක පිටපත (පෙළ) රචනා කරන්නේ කවුද?
ii. නාට්‍ය පිටපතක තිබිය යුතු අංග මොනවාද?
iii. කතන්දරයක් හා නාට්‍යයක් අතර වෙනස පැහැදිලි කරන්න.

04) i. නාට්‍යයක වේශභූෂණ යනු මොනවාද?
ii. වේෂභූෂණ නිර්මාණය කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් ලියන්න.
iii. රජු හෝ බිසවකට සුදුසු වේෂභූෂණ නිර්මාණ කර වර්ණ ගන්වන්න.

05) i. අභිරූපනය යනු කුමක්ද?
ii. අභිරූපන රංගනයක් සාමූහිකව කළ හැකි අවස්ථා හතරක් නම් කරන්න.
iii. අභිරූපන රංගනයක දැකිය හැකි විශේෂ ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න.

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## නාට්‍ය හා රංගකලාව - පිළිතුරු පත්‍රය

නම / විභාග අංකය:

**I - කොටස**

| | | | |
|---|---|---|---|
| 1 - 3 | 6 - ආහාර්ය අභිනය | 11 - 1 | 16 - 2 |
| 2 - 4 | 7 - රංග විධාන | 12 - 2 | 17 - 1 |
| 3 - 3 | 8 - තේමාව | 13 - 2 | 18 - 1 |
| 4 - 2 | 9 - පරිකල්පනය | 14 - 4 | 19 - 4 |
| 5 - 1 | 10 - ගැටුම | 15 - 3 | 20 - 2 |

ලකුණු (1 x 20 = 20)

**II - කොටස**

01) 1. මාෂා සහ වලහා
2. ඩී. කුමාරගේ
3. (තනිවම), (හැඩුම් ස්වරයෙන්)
4. මාෂා හා වලහා
5. වලහා, මී මැස්සෝ ලකුණු (2 x 5 = 10)

02) 1. 4 (ලකුණු 02)
2. ආංගික අභිනය, වාචික අභිනය, සාත්වික අභිනය, ආහාර්ය අභිනය. (ලකුණු 04)
3. **ආංගික අභිනය** - ශරීරයේ අංග ප්‍රත්‍යාංග උපාංගයෙන් අදහසක් ප්‍රකාශ කිරීමයි.
මනමේ නාට්‍යයේ වැදි රජු හා මනමේ කුමරු අතර ඇතිවන සටන උදාහරණයක් ලෙස දැක්විය හැකිය.
**වාචික අභිනය** - වචන දෙබස් සංවාද ගීත ආදියෙන් කිසියම් අදහසක් ප්‍රකාශ කිරීමයි
උදාහරණ -: මනමේ නාට්‍යයේ ගීත... ප්‍රේමයෙන් මන රංජිත වේ නන්දිත වේ... යන ගීතය.
**සාත්වික අභිනය** - නළුවාගේ මුහුණෙහි දක්නට ලැබෙන භාවයන් (හැඟීම්, ඉරියව් ආදියෙන් අදහස් ප්‍රකාශ කිරීමයි
උදාහරණ -: දුක, සතුට, බය විශ්මය ආදී
**ආහාර්ය අභිනය** - වේදිකාවට පිටතින් ගෙනෙන දේවල් මගින් කිසියම් අදහසක් ප්‍රකාශ කිරීම.
උදාහරණ -: වේෂභූෂණ, සංගීතය, අංගරචනය, රංගාලෝකය, පසුතල ආදිය. (ලකුණු 03)

03) 1. පිටපත් රචකයා (නාට්‍ය පෙළ රචකයා) (ලකුණු 02)
2. කතා පුවත සංවාද හා දෙබස් චරිත ගැටුම නාට්‍යෝචිත අවස්ථා රංගවිධාන (ලකුණු 04)
3. **කතන්දරය** - මුල මැද අග පිළිවෙලට ඇති කතාවකි. / එක දිගට කියවා රස විඳියි
කතාවේ පසුබිම පරිසරය වර්ණනාත්මකව ඉදිරිපත් කරයි
කාලය සීමාවක් නැත... ආදී ලෙස කරුණු දක්වා තිබිය යුතුය

නාට්‍ය - කතා පුවතක් ඇත

මුල මැද අග අනුපිළිවෙලට තිබීම අවශ්‍ය නොවේ

අසා බලා රසවිඳී

නාට්‍යෝචිත අවස්ථා හා සිද්ධි තිබිය යුතුය

කාලය සීමා කර ඇත... ආදී ලෙස කරුණු දක්වා තිබීම. (ලකුණු 4)

04) 1. නාට්‍යක චරිත වලට අදාළ රංග වස්ත්‍රාභරණ හෙවත් ඇඳුම් පැළඳුම් වේශ භූෂණ ලෙස හඳුන්වයි (ලකුණු 02)

2. නාට්‍යයේ ශෛලියට ගැලපෙන ලෙස

කාලයට දේශයට යුගයට ගැලපෙන ලෙස

නළු කාර්යට පහසු වන ආකාරයට

බාහිර සමාරෝපය සඳහා

චරිත වලට උචිත ලෙස බාහිරව හඳුනාගැනීමට... ආදී කරුණු දක්වා තිබීම. (ලකුණු 02)

3. රජු හෝ බිසවකට සුදුසු වේශභූෂණ නිර්මාණය කර (සිතුවම්කර) වර්ණ ගන්වා ඇත්නම් සම්පූර්ණ ලකුණු දෙන්න (ලකුණු 06)

05) 1. සංවාද භාවිත නොකර ආංගික හා සාත්වික අභිනය මගින් කිසියම් සිද්ධියක් හෝ අවස්ථාවක් නිරූපණය කිරීමයි. (ලකුණ 02)

2. වෙළඳපොළක්...කර්මාන්තශාලාවක්...ක්‍රීඩා කරන අවස්ථාවක් (වොලිබෝල්, නෙට්බෝල්, ක්‍රිකට්),බස් නැවතුම්පළක අවස්ථාවක්, පන්ති කාමරයක සිදුවන කිසියම් සිද්ධියක්... ආදී ලෙස උචිත මාතෘකා ලියා ඇත්නම් ලකුණු දෙන්න. (ලකුණු 04)

3. චලනවල කිසියම් රිද්මයානුකූල බවක් තිබීම, තාත්විකත්වය ඉක්මවූ අධිරංගන ස්වභාවයක් ගනියි, අතිශයෝක්තියෙන් යුක්ත නිරූපණයකි, සැබෑ ලෝකයේ ද්‍රව්‍ය පරිහරණය නොකරයි. හිස් අවකාශයේ සියලු ද්‍රව්‍යයන්හි හැඩය, බර, ප්‍රමාණය පැහැදිලි ලෙස මවාපායි. මිනිස් සිරුර භාවිතය තුළින් විවිධ දේ මවා පෑමට හැකි ආකාරයේ අවස්ථාවන් හා සිදුවීම් තෝරා ගනියි.

(ලකුණු 04)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 08 - 2023

## නාට්‍ය හා රංගකලාව - ප්‍රායෝගික පරීක්ෂණය

නම / විභාග අංකයː

**● පහත සඳහන් ප්‍රායෝගික පරීක්ෂණයන් සිදුකර එක් අංගයකට ලකුණු 10 බැගින් ලබා දෙන්න.**

01. 8 ශ්‍රේණියට අදාළ පෙළ ආශ්‍රිත ( මාෂා හා වලහා නාට්‍ය පෙළ) සංවාද කාණ්ඩයක් කියවීම.

02. නාට්‍ය ගීතයක් රංගනය කරමින් ගායනා කිරීම.

03. එකම වචනය අර්ථ තුනක් ප්‍රකාශ වන ආකාරයට උච්චාරණය කිරීම.

04. සාමූහික වශයෙන් ජනකතාවක් රඟ දැක්වීම.

05. පහත සඳහන් චරිත වලින් එකක් තෝරා ගෙන නිරූපණයක් කිරීම.

- හිඟන්නා
- ශාස්ත්‍රකාරයෙක් / කාරියක්
- මාළු වෙළෙන්දෙක්
- උමතු චරිතයක්
- බස් කොන්දොස්තරවරයෙක්